**ශීර්ෂය 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව පිළිබඳව විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුලා වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 154(1) ව්‍යාවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 නොවැම්බර් 28 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරනු ලැබේ. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යාවස්ථාවන්, වෙනත් ව්‍යාවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුලා හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,058.62 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,336.20 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 722.42 ක් හෙවත් සියයට 35 . 09 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 403.92 | 397.56 | 6.36 | 1.57 |
| මුලධන | 1654.70 | 938.64 | 716.06 | 43.27 |
| එකතුව | 2058.62 | 1336.20 | 722.42 | 35.09 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව වෙත ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් එකතුව රු.මිලියන 26.27 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 18.39 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 7.88 ක් හෙවත් සියයට 30 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා රු.මිලියන 25.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.මිලියන 22.8 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තුමේන්තුගත ආදායමෙන් සියයට 91.2 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඌනතාවය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඌනතාවය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10.03.07.06 | 25.00 | 22.80 | 2.2 | 8.8 |

## 2.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුව අදාළ විෂය අංක 29001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 22.00 | 21.97 | 15.00 | 19.57 | 105.00 | 76.37 |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 73.88 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු: මිලියන |
| 6000/0000/00/0013/0064/000 | 68.62 |
| 6000/0000/00/0016/0047/000 | 1.41 |
| 6000/0000/00/0018/0055/000 | 0.05 |
| 6000/0000/00/0006/0073/000 | 3.80 |
| එකතුව | 73.88 |

## 2.5 විගණන නිරීක්ෂණය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

# 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
| --- | --- | --- |
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

## 3.2 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් 10.03.07.06 දරන ආදායම් සංකේතය යටතේ බලපත්‍ර ගාස්තු සඳහා ආදායම් ඇස්තුමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාලව සිදුකළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු. 100,000 ක ආදායම් හිඟහිට තිබුණ අතර එම හිඟහිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 03ක් අතර කාල පරාසයකට අදාල විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ආදායම් ගිණුම අනුව හිඟ ආදායම රු.100,000 ක් ලෙස දක්වා තිබුණ ද එදිනට හිඟ ආදායම රු.45,000 ක් විය. ඒ අනුව වෙනස රු.55,000 ක් බව නිරීක්ෂණය විය.

(ඇ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී අජීවී බෙල්ලන් ප්‍රවාහනය හා මුහුදු ජලජ ජීවීන් උපස්ථර අපනයන ආදායම පිළිවෙලින් රු. 871,750 ක් හා රු.2,395,200 ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීම පිළිවෙලින් සියයට 18 ක් හා සියයට 70 ක් විය.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 29001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට හිඟහිටි ණය ශේෂය රු.918,939 වූ අතර එම ණය ශේෂ වර්ෂ 02 සිට වර්ෂ 19 දක්වා වූ කාලයක සිට පැවත එමින් තිබුණ ද ඒවා අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### වාර්ෂික කාර්සාධන වාර්තා

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2017 අගෝස්තු 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.5 දේශීය මූල්‍යකරණය මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### ඉන්ධන මිල වැඩි වීම නිසා ධීවර කර්මාන්තයට වූ අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ධීවර යාත්‍රා හිමියන්ට ඉන්ධන සහනාධාර ලබා දීම වෙනුවට විකල්ප සහනාධාර ලබා දීම

ඉහත සහනාධාරය යටතේ ධීවර යාත්‍රා සුපරීක්ෂණ පද්ධතියක් මිලදී ගැනීම හා ස්ථාපනය කිරීම සඳහා 2015 හා 2016 වර්ෂවලදී රු.මිලියන 589.56 ක් වැයකර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් තොරතුරු අනාවරණය විය.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.4 මාර්ගෝපදේශය ප්‍රකාරව උපරිම තරඟයක් ඇති කිරීම තහවුරු කිරීම සඳහා විවිධ මාධ්‍ය මඟින් ප්‍රසම්පාදන දැන්වීම් පලකර ජාත්‍යන්තර වශයෙන් ප්‍රචාරයක් ලබාදිය යුතු බව දක්වා ඇතත් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව මෙම මිලදී ගැනීම් සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවක් මගින් සිදුකළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) සුපරීක්ෂණ පද්ධතිය වෙනුවෙන් අවශ්‍ය ට්‍රාන්ස්පොන්ඩර් 3000 ක් දින 540 ක් තුළ මිලදී ගෙන ස්ථාපනය කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2014 නොවැම්බර් 12 දින ගිවිසුමකට එළඹ තිබුණ ද එම ආයතනය අදාල සැපයුම සඳහා තෝරාගත් පදනම විගණනයට අනාවරණය නොකෙරුණි.

(ඈ) උක්ත ගිවිසුම සංශෝධනය කර ට්‍රාන්ස්පොන්ඩර් 1500 ක් දින 180 ක් තුල සපයා ස්ථාපනය කිරීම සඳහා 2015 පෙබරවාරි 7 දින නැවත ගිවිසුමකට එළඹ තිබුණි. සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල කේවල් කිරීමේ කමිටුවක් පත්කර තිබුණි. එහිදී යුරෝ 80,000 ක් වූ අයිතම 2 ක් යුරෝ 88,000 ක් දක්වා ඉහළ නංවා තිබුණු අතර යුරෝ 40,000 ක් වටිනා අයිතම 2 ක් ඉවත් කර තිබුණි.

(ඉ) මෘදුකාංග ස්ථාපනය සඳහා උපදේශන කණ්ඩායම් 5 ක් පුහුණු කිරීම වෙනුවෙන් යුරෝ 25,000 ක් 2016 අප්‍රේල් 20 දින සැපයුම්කරු වෙත ගෙවා ඇති නමුත් පුහුණු කිරීම් සිදුකළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) යාත්‍රා සුපරීක්ෂණ කට්ටලයක් යාත්‍රාවකට සවි කිරීමේ දී යාත්‍රා හිමිකරු සහ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ සමඟ ගිවිසුමකට එළඹිය යුතු වුවත් එම ගිවිසුම් පිටපත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(උ) යාත්‍රා නිරීක්ෂණ කට්ටල සවි කිරීම සම්බන්ධ තොරතුරු යාත්‍රා සුපරීක්ෂණ ව්‍යාපෘතිය විසින් පවත්වා ගතයුතු වුවත් විගණනයට ඉදිරිපත් කළ ලේඛනයෙහි යාත්‍රා මෙහෙයුම් අංක, යාත්‍රා කට්ටල සවි කළ දිනය යනාදි තොරතුරු කිසිවක් ඇතුළත් කර නොතිබුණි.

(ඌ) සුපරීක්ෂණ පද්ධතියට දත්ත ලබා ගැනීම සඳහා ආයතනයක් තෝරා ගැනීමේ දී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණු අතර 2016 අගෝස්තු වන විට එම ආයතනයට රු.මිලියන 52.17 ක් ගෙවා තිබුණි.

(එ) ඉහත ව්‍යාපෘතියේ අරමුණු අතර මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම ප්‍රධාන අරමුණක් වුවත් 2014 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ දී මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 2310 කින් පමණ පහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය.

**3.6 කාර්යසාධනය**

----------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

--------------------------------------------------

මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම, ගොඩබාන මසුන්ගේ ප්‍රමිතිය වැඩි දියුණු කිරීම හා ධීවර යාත්‍රා පද්ධතිය වැඩි දියුණු කිරීම උදෙසා අඩි 55ක් දිගැති බහුදින ධීවර යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

- බෝට්ටු අච්චුවක් අලුතින් නිෂ්පාදනය කර එම අච්චුවෙන් බෝට්ටුව නිපදවීම සඳහා පිළිවෙලින් රු. මිලියන 22 ක් හා රු. මිලියන 26 ක් සීනෝර් ආයතනයට ගෙවා ඇතත් බෝට්ටුව නිෂ්පාදනය සඳහා පැරණි අච්චුවක් භාවිත කර ඇති බව 2016 සැප්තැම්බර් 21 දිනැති නාවික ඉංජිනේරු සහකාරගේ අධීක්ෂණ වාර්තාව අනුව දක්වා තිබුණි. එසේ වුවද ඒ සඳහා ගෙවන ලද මුදල් ආපසු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. ඒ අනුව රු. මිලියන 22 ක වියදම නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය.

(ආ) ධීවර දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් වැය විෂය යටතේ රු.19,140,181 ක් වියදම් දරා තිබුණි. ඒ සම්බන්ධ වු නිරීක්ෂණ පහත දැක්වේ.

- ඉහත වැය විෂයය යටතේ රු.5,653,539 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල 4 ක් වෙත ලබාදී තිබුණු අතර රු.3,645,457 ක් වැය කර තිබුණි. එම වැය කිරීම්වලට අදාල භෞතික ප්‍රගතිය හා කාර්යසාධන වාර්තා ගෙන්වා ගැනීමට හෝ අදාල දිස්ත්‍රික් ධීවර කාර්යාල මඟින් අධීක්ෂණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

- තංගල්ල නිලනිවාසය අළුත්වැඩියා කිරීම සඳහා රු.1,722,332 ක ප්‍රතිපාදන 2016 දෙසැම්බර් 29 දින හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබුණ ද එම ප්‍රතිපාදන වර්ෂය අවසානයේ ලබාදීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

## 3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම හා ගොඩබාන මසුන්ගේ ප්‍රමිතිය වැඩි දියුණු කිරීම උදෙසා ධීවර යාත්‍රා පද්ධතිය වැඩි දියුණු කිරීම යටතේ වැඩි කාර්යක්ෂමතාවයකින් යුත් බෝට්ටු 10 ක් නිපදවීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බෝට්ටු ලබා ගන්නා ප්‍රතිලාභීන් විසින් සීනෝර් ආයතනය නිපදවන බෝට්ටු ලබා ගැනීමට ප්‍රතික්ෂේප කිරීම නිසා ඔවුන් නම් කරණු ලබන ආයතනවලින් නිෂ්පාදනය කර දීමට ප්‍රසම්පාදන මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. ඒ සඳහා කිසිදු අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර එය ඉහත කාර්යය සඳහා අනුමැතිය ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනි කාර්යයක් බව නිරීක්ෂණය විය.

(ii) 2016 ඔක්තෝබර් 29 දින ඉදිරිපත් කළ බෝට්ටු ප්‍රතිලාභී ලැයිස්තුව අනුව බෝට්ටු නිපදවන ආයතනය ද ප්‍රතිලාභීයකු ලෙස ඇතුළත් වී තිබීම මතභේදයට කරුණක් වී තිබුණි.

(iii) බෝට්ටු 5 ක් පමණක් නිපදවීම සඳහා ඇණවුම් ලබා දී තිබිය දී බෝට්ටු 10 ක් සඳහා වන මුළු වටිනාකම වූ රු. මිලියන 149.5 ක් සීමා සහිත සීනොර් ආයතනයට 2016 දෙසැම්බර් මාසයේ දී ගෙවා තිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

--------------------

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව, ප්‍රසම්පාදනයක් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කළ යුතු වුවත් රු. මිලියන 2.84 ක් වටිනා රේඩියෝ උපකරණ මිල දී ගැනීම සම්බන්ධයෙන් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ද නිරීක්ෂණය විය.

(i) ඉහත මිල දී ගැනීම සඳහා පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ අංක 3-iii හි උපදෙස් ප්‍රකාරව රේඩියෝ උපකරණ සම්බන්ධයෙන් අති විශේෂ දැනුමක් ඇති මණ්ඩලයක නිර්දේශ මත මිල දී ගන්නා ලෙස උපදෙස් දී ඇතත් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ii) ලංසු කැඳවීමේ දී විකල්ප ලංසු ඉදිරිපත් කිරීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කළ පරිදි එක් උපකරණයක් රු.890,000ක් බැගින් මිල දී ගැනීමේ හැකියාව අහිමි වී තිබුණි.

(iii) ඉහත මිල දී ගැනීම සඳහා පත්කළ ලංසු විවෘත කිරීමේ කමිටුවට රේඩියෝ උපකරණ මිල දී ගැනීම සඳහා ඉල්ලුම් කළ නිලධාරියා ද පත්කර තිබීම නිසා ප්‍රසම්පාදනයේ අපක්ෂපාතී බවට බලපෑම් එල්ල වී තිබුණි.

(ආ) බහුදින ධීවර යාත්‍රා අළුත්වැඩියාව සඳහා සහනාධාර ලබාදීම යටතේ 2016 වර්ෂයේදී රු.මිලියන 74.22 ක් වියදම් දරා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බහුදින ධීවර යාත්‍රා සහනාධාරලාභීන් තොරා ගැනීමේ දී පිළිගත හැකි නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ii) අළුත්වැඩියාවන් සඳහා ආයතන තෝරා ගැනීමේ දී ප්‍රසම්පාදන මග පෙන්වීම් අනුගමනය කර නොතිබුණු අතර සහනාධාරලාභීන් විසින්ම තම අභිමතය පරිදි බෝට්ටු අළුත්වැඩියාවන් සඳහා ආයතන තෝරගෙන තිබුණි.

## 3.9 අරමුණට පටහැනි අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ දී ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළයුතු කුඩා හා මධ්‍ය පරිමාණ ධීවර කර්මාන්තය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීමේ කාර්යය සඳහා වාර්ෂික විසර්ජන පනත මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් රු. මිලියන 110.71 ක් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට ද රු. මිලියන 32.5 ක් ලංකා ධීවර සංස්ථාවට ද වශයෙන් රු.මිලියන 143.21 ක් සමාලෝචිත වර්ෂයේ දී ලබා දී තිබුණි.

(ආ) ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත ලබා දී තිබුණු මුදලින් රු. මිලියන 5.99 ක් වටිනා ට්‍රැක්ටර් 2 ක්, රු. මිලියන 8.60 ක් වටිනා පාලම් තරාදි 4 ක්, රු. මිලියන 74.13 ක් වටිනා ක්‍රේන් 1 ක් සහ රු. මිලියන 21.89 ක් වටිනා ඉන්ධන පොම්ප 08 ක් මිල දී ගතයුතු බව සඳහන් කර තිබුණ ද මිල දී ගැනීම් කටයුතු අවසන් කර අදාල භාණ්ඩ ලබාගත් බවට තොරතුරු 2017 අගෝස්තු වන විටත් වාර්තා කර නොතිබුණි.

(ඇ) ලංකා ධීවර සංස්ථාව වෙත ලබා දී තිබුණු මුදල් පහත සඳහන් කාර්යයන් සඳහා වැය කළයුතු බව දක්වා තිබුණි.

| | | වටිනාකම රු. මිලියන |
|---|---|---|
| • | 2015 වර්ෂයේ අලුතින් විධායකයන් 11 ක් ඉදිකිරීම සහ ඊට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේ වියදම් පියවා ගැනීම | 13.00 |
| • | මහනුවර විධායකය යටතේ මෙගා මත්ස්‍ය වෙළඳසැලක් ඉදිකිරීම | 5.00 |
| • | ගාල්ල මෝදර අයිස් යන්ත්‍රාගාරයට ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර 2 ක් මිලදී ගැනීම | 10.0 |
| • | ප්‍රාදේශීය අලෙවි මධ්‍යස්ථාන සඳහා විද්‍යුත් ගණක යන්ත්‍ර 75 ක් මිලට ගැනීම. | 4.50 |

(ඇ) ධීවර කර්මාන්තය සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීමට ධීවර දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් ඉහත ආයතන වලට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට කටයුතු කිරීම අරමුණට පටහැනි අවිධිමත් ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය කෙරේ.

## 3.10 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වටිනාකම සඳහන් නොකළ වාහන අනතුරු 13 ක් හා වෙනත් හානි 2 ක් සම්බන්ධයෙන් මුදල්රෙගුලාසි 104 සිට 109 දක්වා වූ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 48 | 41 | 07 | - |
| (ii) | තෘතීයික මට්ටම | 21 | 12 | 09 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 961 | 484 | 477 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 107 | 92 | 15 | - |
| (v) | වෙනත් / අනියම්/ කොන්ත්‍රාත් | - | 01 | - | 01 |
| | එකතුව | **1137** | **630** | **508** | **01** |